# අමරදේව හා හරමානිස්ලා

දැනුම යනු නිර්මාණය කෙරෙන්නක්ය යන්න දැනුම පිළිබඳ ඉතාමත් වැදගත් දැනුමකි. මේ දැනුම ද නිර්මාණයක් නොවන්නේ ද යන ප්‍රශ්නය කිසිවකුගේ සිතට නැඟෙන්නේ නම් එය පුදුම විය යුතු දෙයක් නොවේ. දැනුම යනු නිර්මාණය කෙරෙන්නක් ය යන්න ද නිර්මාණයකි. සිතට නැඟෙන යනුවෙන් පැවසුව ද එහි දී ද සිදුවන්නේ නිර්මාණයකි. මේ සියල්ල නිර්මාණය කරන්නේ මනස ය. දැන් ප්‍රශ්නය වන්නේ මනස යන්න නිර්මාණය කරන්නේ කවුද, එසේත් නැත්නම් කුමක් ද යන්න ය. ඒ ප්‍රශ්නයට ඇති පිළිතුර නම් මනස යන්න නිර්මාණය කරන්නේ ද මනස බව ය. මනස විසින් අන් සියල්ල පමණක් නොව මනස ද නිර්මාණය කෙරෙයි. මනස සියල්ලන්ට ම ප්‍රධාන වන්නේ ය යන බුදු වදන අපට මෙහි දී සිහියට නැඟෙයි.

දැනුම නිර්මාණය කෙරෙන්නක් ය යන්න බටහිර සමාජ විද්‍යාවෙහි ද ඉගැන්වෙන්නකි. ඔවුන්ට අනුව දැනුම සමාජයීය නිර්මාණයකි (සෝෂල් කන්ස්ට්‍රක්ෂන්). ඔවුහු දැනුම සමාජය විසින් නිර්මාණය කෙරෙන්නක් බව කියති. මෙය එතරම් නිරවුල් අදහසක් නොවේ. එහෙත් ඉන් කියැවෙන්නේ ඒ ඒ සමාජය විසින් ඒ ඒ කාලයේ දැනුම නිර්මාණය කෙරෙන බවකි. මෙහි දී දැනුමේ කර්තෘත්වය, එනම් දැනුම නිර්මාණය කරන්නා කවුද යන්න මුළු මහත් සමාජයට ම හිමි වෙයි. මෙහි වැදගත් කමක් වෙයි. යම් දැනුමක් නිර්මාණය කරන්නේ එක් අයකු පමණක් වුව ද ඒ තැනැත්තා දැනුම නිර්මාණය කරන්නේ යම් සමාජයීය පසු බිමක ය. දැනුම සමාජයීය නිර්මාණයක් වේය යන්නෙන් මේ පසුබිමෙහි ඇති වැදගත්කම කියැවෙයි. බටහිර සමාජ විද්‍යවෙහි දැනුම සමාජයීය නිර්මාණයක් යැයි කීව ද අප කියන්නේ දැනුම ඉන්ද්‍රිය පද්ධතියට, මනසට හා සංස්කෘතියට සාපේක්ෂ බව ය. එය දැනුම සමාජයීය නිර්මාණයක් වේය යන්නට වඩා පළල් වුවකි. එහි සමාජයේ බලපෑම සංස්කෘතියට සාපේක්ෂ යන්නෙන් කියැවෙයි. එසේ ම එහි දී පුද්ගලයාගේ වැදගත් කම දැනුම මනසට සාපේක්ෂ යන්නෙන් කියැවෙයි. දැනුම ඉන්ද්‍රිය පද්ධතියට සාපේක්ෂ යන්නෙන් වෙනත් ඉන්ද්‍රිය පද්ධතීන් ඇති සතුන් ද (මනස එහි දී ද බලපායි) දැනුම නිර්මාණය කරන බවත් වෙනත් ඉන්ද්‍රිය පද්ධතියක් තිබිණි නම් අප නිර්මාණය කරන දැනුම දැනට නිර්මාණය කෙරෙන දැනුමෙන් වෙනස් වන බවත් පැවසෙයි.

බෝසතාණන් වහන්සේ සිදුහත් කුමරු ලෙස ඉපදීමට පෙර තව්තිසා දෙව්ලොව සිට පස් මහ බැලුම් බැලූ බව බෞද්ධ සාහිත්‍යයෙහි සඳහන් වෙයි. බුදු වීම යනු දැනුම නිර්මාණය කිරීමක් නොවුණ ද, දැනුම නිර්මාණය නොකිරීම බුදු වීමෙහි දී වැදගත් වුව ද, එහි දී පවා සමාජ පසුබිම වැදගත් වන බව මේ කරුණින් පැහැදිලි වෙයි. දැනුම නිර්මාණය කිරීම නිසා ම සාංසාරික ගමනක් ඇති බව හා මේ සාංසාරික ගමන නැවැත්විය හැකි බව තේරුම් ගත හැක්කේ, හා විශේෂයෙන් ම තේරුම් කර දිය හැක්කේ, සාංසාරික ගමනක් ගැන කියැවෙන සමාජයක ය. එකල භාරතයේ සංසාරය, විමුක්තිය වැනි සංකල්ප තිබිණි. එවැනි සංකල්ප නොමැති සමාජයක බුදු වීම ගැටළු සහගත විය හැකි ව තිබුණි. සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පෙරුම් පිරූ බෝසතාණන් වහන්සේට කොහේ බුදු වන්නට බැරි ද යන ප්‍රශ්නය ඇසිය හැකි වුවත් සමාජයෙන් ලැබෙන යම් උත්තේජනයක් එහි දී වැදගත් වන්නේ යැයි අපට සිතා ගත හැකි ය. ඒ කෙසේ වෙතත් මෙහි දී තවත් ප්‍රශ්නයක් පැන නගියි. එනම් බුදු වීමෙන් පසුව නිවන ගැන මිනිසුන්ට දේශනා කිරීම පිළිබඳ ප්‍රශ්නය ය. නිවන ගැන දේශනා කිරීමට සංසාරය ගැන යම් දැනුමක් අවශ්‍ය වෙයි. සංසාරය යන්න අසාවත් නැති ජන සමූහයකට නිවන ගැන කියා දීම මහත් ප්‍රශ්නයක් වනු නොඅනුමාන ය. බෝසතාණන් වහන්සේ ඇස්කිමෝවරයකු ලෙස ඉපිද කෙසේ හෝ බුදු විණි යැයි සිතමු. දැන් බණ කියන්නේ කාට ද? භාරතයේ පවා තමන් වහන්සේ ධර්මය දෙසිය යුත්තේ කාහට ද, මිනිසුන්ට ඒ අවබෝධ කර ගැනීමට හැකි වේද ආදී අදහස් බුදුන් වහන්සේට ඇති විය. එසේ නම් සංසාරයක් ගැන මෙලෝ හසරක දැනුමක් නැති ඇස්කිමෝවරුන් ගැන කියනුම කවරේ ද? ධර්මාශෝක රජු දවස රටවල් කිහිපයකට ම ධර්ම දූතයාණන් වහන්සේ වැඩිය ද ලංකාවේ මෙන් අනෙක් රටවල බුදු දහම මුල් අල්ලා ගත්තේ නැත්තේ ඇයි? අවුරුදු පන්සියයක පමණ කෲර යටත් විජිත වාදයක් තුළ වුව ද මෙරටින් බුදු සසුන නැති වී නොගියේ ඇයි? අද අප බෞද්ධ සංස්කෘතියක් තුළ දැනුම් නිර්මාණයක් ගැන කතා කරන විට බටහිර දැනුම් ඒකාධිකාරයක් තුල පවා ඒ ගැන යම් පමණකට හෝ මෙරට සවන් දීමක් කෙරෙන්නේ ඇයි? බුදු සසුන පවතින්නේ මෙරට යැයි ජනප්‍රවාදයක් ගොඩ නැඟී ඇත්තේ ඇයි? අද පවා බටහිරයන් මෙරටින් සිංහල බෞද්ධ සංස්කෘතිය නැති කර දැමීමට වලි කන්නේ ඇයි? බුදු දහම හා ප්‍රාග් බෞද්ධ යුගයේ සිට අපේ සංස්කෘතිය අතර යම් සම්බන්ධයක්

© Prof. Nalin De Silva

නොවේ ද? මේ සම්බන්ධය මිහිඳු මහා රහතාණන් වහන්සේ දෙවන පැතිස් රජතුමාගෙන් ඇසූ ප්‍රශ්නවලින් හා ඒවාට රජතුමා දුන් පිළිතුරුවලින් පිළිබිඹු වන්නේ යැයි සිතමි.

දැනුම සමාජයීය නිර්මාණයක් ය යන්නෙහි නිර්මාණය කෙරෙන්නක් ය යන අදහස සමග ම පිළිගැනීම යන අදහස ද වෙයි. යම්කිසි පුද්ගලයකු යම් දැනුමක් නිර්මාණය කිරීමේ දී ඒ තැනැත්තාට සමාජ පසුබිම බලපාන අතර ඒ දැනුම සමාජය විසින් පිළිගනු ලැබීමට ද අවසානයේ දී බලපාන්නේ සමාජය ය. සමාජයට ඒ නිර්මාණය කරන ලද දැනුම අවශ්‍ය වේ ද  යන්න එහි දී බලපාන ප්‍රධාන ම සාධකය වෙයි. නිර්මාණය කරන ලද දැනුම සමාජයට අවශ්‍ය නොවේ නම් එය වැඩි දෙනකුගේ සැලකිල්ලට භාජනය නොවී පැත්තක තිබෙන දෙයක් බවට පත් වනු ඇත. සමාජයට අවශ්‍ය වේය යන්න එතරම් සරල අදහසක් නොවේ. සමාජයකට අවශ්‍යතාවයක් බලෙන් ඇතුළත් කර ලිය හැකි ය. අවශ්‍යතාවය යන්න ද අවසාන වශයෙන් ගත් කල නිර්මාණයකි. අපේ අවශ්‍යතා නිර්මාණ වෙයි. වෙළෙඳ දැන්වීම් මගින් කෙරෙනුයේ අවශ්‍යතා නිර්මාණය කිරීමකි. අද සෙල් හෙවත් සෙලියුලර් නැත්නම් ජංගම දුරකථනය විශාල පිරිසකගේ අවශ්‍යතාවයක් බවට පත් වී ඇත. පත් වී ඇත යැයි කීව ද එය පත් කිරීමකි. නිර්මාණ බිහිවන්නේ සමාජ පසුබිමක ය. එලෙස ම නිර්මාණ පිළිගැනෙන්නේ ද සමාජ පසුබිමක ය. අනෙක් අතට සමාජය සැකසෙන්නේ ද මිනිසුන්ගේ නිර්මාණ හේතුකොට ගෙන ය.

දැනුම නිර්මාණය හා පිළිගැනීම අතර ඇත්තේ චක්‍රීය සම්බන්ධයකි. අපට එක් තැනකින් පටන් ගත නොහැකි ය. සමාජය නිර්මාණය කරනු ලබන්නේ මිනිසුන් විසිනි. එහෙත් මිනිසුන් නිර්මාණය කිරීමේ දී සමාජය ද දායක වෙයි. මිනිසකු යනු සමාජයෙහි පමණක් නිපැයුමක් ප්‍රතිඵලයක් නොවේ. සසර එක් කරගත් පුරුදු, කුසලතා, දුර්වලකම් ආදිය මෙන් ම ජෛවීය ගුණාංග ද මිනිසකු නිර්මාණයෙහි දී වැදගත් වෙයි. එහෙත් ඒ අතර ම සමාජය ද මිනිසකු නිර්මාණය කිරීමේ දී වැදගත් කාර්යයක් සිදු කරයි. මා එංගලන්තයේ ඉපදිණි නම් වෙනස් ආකාරයකින් කටයුතු කරනු නොඅනුමාන ය. එක් තැනකින් පටන් ගැනීමට නොහැකි වුව ද අපේ කතාබස් සඳහා අපට යම් ආරම්භයක් තිබිය යුතු ය. අප දෙන ලද සමාජයක් ගනිමු. මේ සමාජයෙහි ප්‍රධාන සංස්කෘතියක්, ප්‍රධාන චින්තනයක් ඇත. (අද ලංකාවෙහි සිදු වන්නේ මෙරට සිංහල බෞද්ධ සංස්කෘතියට හිමි තැන අහිමි කිරීම ය. මෙය දැනට අවුරුදු පන්සියයක් පමණ කාලයක් තුළ කෙරී ගෙන යයි.) මෙයට අමතර ව අප්‍රධාන හා ආන්තික සංස්කෘතීන් හා චින්තන වෙයි. මේ සමාජයෙහි ජීවත්වන යම් පුද්ගලයකු යම් නිර්මාණයක් කෙළේ යැයි සිතන්න. ඒ පුද්ගලයා ඒ නිර්මාණය කරන්නේ අර සංස්කෘතීන් එකක් හෝ කිහිපයක මිශ්‍රණයක් හා එක චින්තනයක් හෝ චින්තන කිහිපයක මිශ්‍රණයක් තුළ ය. එහි දී පුද්ගලයාගේ සසර පුරුදු, කුසලතා, වාසනාව, ප්‍රතිභාව ආදිය ද බලපායි. එහෙත් නිර්මාණයක් බිහි කළ පමණින් එය සමාජය විසින් නොපිළිගැනෙයි. සමාජයෙහි ඒ සඳහා ඉල්ලුමක් තිබිය යුතු ය. ඉල්ලුමක් නැත්නම් ඒ නිර්මාණය තල්ලු වී යයි. සමහර විට එය පසු කලෙක දී සමාජය විසින් පිළිගැනෙනු ඇත. එසේත් නැත්නම් සමාජය විසින් අමතක කෙරෙනු ඇත. සමාජය නිර්මාණය පිළිගන්නේ සමාජය එයට සූදානම් නම් පමණකි. සමාජයේ කෙරෙන විවිධ පූර්ව නිර්මාණ මගින් සමාජය එ සඳහා සූදානම් කෙරෙයි. මෙහි ඇති චක්‍රීය භාවය නැති කළ නොහැකි ය. ඇරිස්ටෝටල්ගේ න්‍යායට (ලොජික් - න්‍යාය යනු තර්කය නොවේ. අපි යම් න්‍යායක් තුළ තර්ක කරමු.) මෙය එකඟ නොවුන ද අපට එහි දී කළ හැකි අන් දෙයක් නැත. අපට කිව හැක්කේ ඇරිස්ටෝටලීය න්‍යාය මෙහි දී වලංගු නොවන බව ය. අප ඇරිස්ටෝටලීය න්‍යායට වහල් නොවිය යුතු ය.

බටහිර විද්‍යාව බිහි වුයේ යම්කිසි සමාජයීය පසුබිමක ය. කොපර්නිකස්, ගැලීලියෝ වැනි පඬිවරු වෙනත් සමාජයක බිහිවීමට ඉඩක් නැත. කොපර්නිකස් ඉදිරිපත් කෙළේ යැයි කියන සූර්ය කේන්ද්‍රවාදය භාරතයේ තිබුණ නමුත්, ගැලීලියෝ හඳුන්වා දුන්නේ යැයි කියන පරීක්ෂණාත්මක ක්‍රමය ලෝකයට, විශේෂයෙන් ම භාරතයට අළුත් දෙයක් නොවූ නමුත්, මාලිමා යන්ත්‍රය, වෙඩි බෙහෙත්, මුද්‍රණ ශිල්පය වැනි දෑ චීනය දැන සිටි නමුත් මේ එකදු රටකවත් බටහිර විද්‍යාව වැනි දැනුම් පද්ධතියක් බිහි නොවී ය.  එයට හේතුව වුයේ ඒ රටවල එවැනි දැනුම් පද්ධතියක් බිහිවීම සඳහා අවශ්‍ය පසුබිම නොතිබීම ය. බටහිර විද්‍යාව වැනි දැනුම් පද්ධතියක් බිහි වී පිළිගනු ලැබීමට යම් ආකල්ප, දර්ශනයක්, න්‍යායක්, කෙටියෙන් කියන්නේ නම් චින්තනයක් අවශ්‍ය වෙයි. එමෙන් ම ඒ සමාජයට එවැනි දැනුමක ඇති අවශ්‍යතාවක් ද තිබිය යුතු ය.

© Prof. Nalin De Silva

බටහිර විද්‍යාවෙහි කෙරෙන නිර්මාණ හා බටහිර විද්‍යාව බටහිර යුරෝපයේ පිළිගැණුනු ආකාරය තේරුම් ගැනීමෙහි ලා උපකාරීවන වෙනත් දෙයක් සළකා බලමු. කලාවෙහි යම් නිර්මාණයක් පිළිගැනේනේ කෙසේ ද? යම් කිසි සාහිත්‍යකරුවකු ජනතාවගේ මනස ග්‍රහණය කර ගත්තේය (කැප්චර්ස් ද මයින්ඩ්) යනුවෙන් ඉංගිරිසි කියමනක් වෙයි. මෙහි මනස යනු ඒ (උප) සමාජයේ බොහෝ දෙනකුගේ පොදු මනස ය. ඉන් කියැවෙන්නේ ඒ පොදු මනස එතරම් නිරවුල් ව නිශ්චිතව ප්‍රකාශ නොකළ, එහෙත් අවිඥානික ව යම් දළ ආකාරයකට ග්‍රහණය කරගත් දෙයක් සාහිත්‍යකරුවා වඩා නිරවුල් ව, ප්‍රකාශ කර ඇති බව ය. යම් සුදානමක සිටි පොදු මනස සාහිත්‍යකරුවාගේ අදහස නිරායාසයෙන් ම වැළඳ ගනියි. අමරදේව මහතාගේ ගීත සමාජයේ එක් කුඩා තීරුවක ජනප්‍රිය වී ඇත. මේ කුඩා තීරුව සමාජයේ බලය හසුරුවන පුද්ගලයන්ගෙන් ද සමන්විත නිසා ඒ ගීතවලට හා අමරදේව මහතාට සමාජ බලයක් ද හිමි වී ඇත. අමරදේව මහතා හා ඒ ගීත බිහිවූයේ කෙසේ ද? එය සමාජයේ යම් තීරුවක පිළිගැනීමට ලක් වූයේ කෙසේ ද? අමරදේව මහතා බිහි කරනු ලැබුයේ එවකට තිබූ ලංකා විශ්ව විද්‍යාලය (අද ලංකා විශ්ව විද්‍යාලය නැත. එය 1942 සිට විවිධ ස්වරූපවලින් තිබී 1978 දී අහෝසි කර දමන ලදී.) හා එහි පූර්වගාමියා වූ 1924 දී පිහිටුවන ලද විශ්ව විද්‍යාල ආයතනය විසින් යැයි කීම නිවැරදි ය. විශ්ව විද්‍යාල ආයතනයෙහි හා ලංකා විශ්ව විද්‍යාලයෙහි එවකට පෙරදිග අධ්‍යයන පීඨය නමින් පීඨයක් විය. ලංඩන් විශ්ව විද්‍යාලයේ පෙරදිග අධ්‍යයන ආයතනය අනුකරණය කරමින් පිහිටුවන ලද මේ පීඨය අද ලංකාවේ කිසිම විශ්ව විද්‍යාලයක දක්නට නොලැබෙන්නේ අද අපේ රටේ විශ්ව විද්‍යාල අනුකාරකත්වයෙන් මිදී ඇති බැවින් නොවේ. අද අනුකාරකත්වයේ ඉහළට ම ගොස් මේ පීඨයෙහි උගන්වන ලද විෂය කලා හා මානව විද්‍යා පීඨවලට ඇතුළත් කරගෙන ඇත. එකල පෙරදිග අධ්‍යයන පීඨවලින් බිහි වූවන්ට විශාල බලපෑමක් කළ පුද්ගලයකු වූයේ රබින්ද්‍රනාත් ඨාගෝර් තුමා ය.

විශ්ව විද්‍යාල ආයතනයේ හා එවකට තිබූ ලංකා විශ්ව විද්‍යාලයෙහි පෙරදිග අධ්‍යයන පීඨයක් තිබූ නමුදු එයට ලැබුණේ කුඩම්මාගේ සැලකිල්ල ය. මේ පීඨයෙහි ඉගෙන ගත්තවුන් අනෙක් පීඨවල ශිෂ්‍යයන්, විශේෂයෙන් ම කලා පීඨයේ ශිෂ්‍යයන් විසින් හඳුන්වනු ලැබුයේ හරමානිස්ලා හෙවත් හරාලා ලෙස ය. කලා පීඨයෙහි ශිෂ්‍යයෝ කුල්ටෝ වූහ. ඔවුහු කුල්ටුර් (ඉංගිරිසි කල්චර්, සංස්කෘතිය) යන ජර්මන් වචනයෙන් හැඳින් වූ ආකාරයට සංස්කෘතියක්, එනම් මහේශාක්‍ය බටහිර සංස්කෘතිය, ඇත්තෝ වූහ. කුල්ටන්ට අනුව හරමානිස්ලාට සංස්කෘතියක් නොවී ය. වෙනත් වචනවලින් කිවහොත් පෙරදිග සංස්කෘතිය, සංස්කෘතියක් ලෙස හඳුනාගැනීමට ඔවුහු මැළිවූහ. අමරදේව මහතා බිහිවූයේ, නැතහොත් බිහිකරනු ලැබුයේ මේ හරමානිස්ලාගේ අවශ්‍යතාවයක් සපුරාලීමට ය. මේ අවශ්‍යතාවය බටහිරයන් විසින් ඇතිකරනු ලැබූ ඊනියා මානසික අඩුවක් පිරිමැසීමකට මුල දී ඌනනය විය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva